# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2115/6 - 2019 මාර්තු මස 18 වැනි සඳුදා - 2019.03.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78(xv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍ය අ. ඉබතුල් රවුෆ් හකීම් වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මෙම නියමය මගින්, (2018 ජූලි මස 09 වැනි දින අංක 2079/13 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත) ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින්, එකී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද සහ 1995 නොවැම්බර් මස 07 වන දින අංක 896/2 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන ''සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය'' යන අයිතමයට අනුරූප වන්නා වූ උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන ''6. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයන අංශය'' යන සටහනට ඉක්බිතිව ම පහත දැක්වෙන සටහන ඇතුළත් කිරීමෙන් එකී නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"7. ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය".

අ. ඉබතුල් රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජලසම්පාදන හා
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 මාර්තු මස 06 වැනි දින,
කොළඹ දී ය.

04 - 05

1A - PG 4434 — 518 (2019/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*